## ශ්‍රී ලංකා විනිශ්වයකාරවරයන්ගේ ආයතනය

ශ්‍රී ලංකා විනිශ්වයකාරවරයන්ගේ ආයතනයේ පුරප්පාඩුව පවතින පහත සඳහන් තනතුරු සඳහා අයදුම්පත් ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් කැඳවනු ලැබේ.

**1. කළමනාකරණ සහකාර - තාක්ෂණ (මෘදුකාංග හා දෘඩාංග තාක්ෂණ ශිල්පී) - පුරප්පාඩු 01**

**අවම සුදුසුකම්**
**බාහිර අයදුම්කරුවන් :-**
අධ්‍යාපන :
එක් එක් තනතුරෙහි කාර්ය භාරයට අදාළව තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික / වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතා පස්වැනි මට්ටමට (NVQ - 05) නොඅඩු මට්ටමක දෘඩාංග හා මෘදුකාංග පිළිබඳ ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

තනතුරට විශේෂිත වෙනත් සුදුසුකම්:
ජාතික වෘත්තීය කුසලතා පස්වැනි මට්ටමට (NVQ - 05) නොඅඩු මට්ටමක සහතිකය ලබා ගැනීමෙන් පසු අදාළ ක්ෂේත්‍රයේ වසර 02 ක පළපුරුද්ද.

**අභ්‍යන්තර අයදුම්කරුවන් :**
ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහාවන සුදුසුකම් අදාළ වේ.

**වැටුප් පරිමාණය :**

**2025.03.25** දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2025 අනුව තනතුරට අදාළ මාසික වැටුප් පරිමාණය **රුපියල් 50,540 - 10 x 540 - 7 x 630 – 4 x 1,080 - 20 x 1,280 – රු. 90,270 /-(MA 2-2 - 2025)** ක් වන අතර එම වැටුප හිමි වන්නේ 2027.01.01 දින සිට වේ. මෙම චක්‍රලේඛයේ උපලේඛන II හි විධිවිධාන පරිදි පත්වීම ක්‍රියාත්මකවන දින සිට වැටුප ගෙවනු ලැබේ.

**වයස් සීමාව :**

අයදුම්කරුවන් අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස අවුරුදු 18ට නොඅඩු හා වයස අවුරුදු 45ට නොවැඩි විය යුතුය. (අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.)

**2. කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන) සුදුසුකම් (අනිවාර්ය පොදු සුදුසුකම්)**

**බාහිර අයදුම්කරුවන් :**

අධ්‍යාපන:
සිංහල හෝ දෙමළ භාෂාව, ඉංග්‍රීසි භාෂාව සහ ගණිතය ඇතුලුව විෂයයන් හතරකට සම්මාන සාමාර්ථයන් සහිතව එක් වරකදී විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම.

*සහ*

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී අවම වශයෙන් විෂයයන් තුනක් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත් ව තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන් :**

(*අ*) ප්‍රාථමික ශ්‍රේණිය -ශිල්පීය නොවන, අර්ධ ශිල්පීය සහ ශිල්පීය සේවා ගණයන්හි පහත ‘ආ’, ‘ඇ’ සහ ‘ඉ’ සඳහන් සුදුසුකම් ඇති සේවකයන්ට මේ සඳහා අයදුම් කළ හැකිය.

(*ආ*) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ දී
I. සිංහල / දෙමළ
II. ගණිතය
III. ඉංග්‍රීසි භාෂාව
යන විෂයයන් ඇතුළුව විෂයයන් හතර(04) කට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හය (06) කින් සමත්ව තිබීම.

(පරිගණක වදන් සැකසුම/ යතුරු ලියනය පිළිබඳ තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා පාඨමාලාවක් හදාරා තිබීම හෝ වෙනත් ඒ හා සමාන මට්ටමේ නිපුණතාවයන් අදාළ අවස්ථාවන්හි දී සුදුසුකම් වශයෙන් ඇතුළත් කරනු ලැබිය හැක).

(*ඇ*) සේවයෙහි ස්ථිර පත්වීම් දැරිය යුතු අතර, එම පත්වීම්වල ස්ථිර කරනු ලැබ සිටිය යුතු ය.

(*ඉ*) නියමිත දිනට පූර්වාසන්නව ස්ථිර පත්වීමක යටත් පිරිසෙයින් අවුරුදු 05 ක අඛණ්ඩ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කොට තිබිය යුතු ය.

**වැටුප් පරිමාණය :**

**2025.03.25** දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2025 අනුව තනතුරට අදාළ මාසික වැටුප් පරිමාණය **රුපියල් 46,220 - 10 x 540 - 7 x 630 – 12 x 1,080 - 12 x 1,280 – රු. 84,350 /-(MA 1-2 - 2025)** ක් වන අතර එම වැටුප හිමි වන්නේ 2027.01.01 දින සිට වේ. මෙම චක්‍රලේඛයේ උපලේඛන II හි විධිවිධාන පරිදි පත්වීම ක්‍රියාත්මකවන දින සිට වැටුප ගෙවනු ලැබේ.

**වයස් සීමාව :**
අයදුම්කරුවන් අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස අවුරුදු 18ට නොඅඩු හා වයස අවුරුදු 45ට නොවැඩි විය

යුතු ය. (අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.)

**සෑම අයදුම්කරුවෙක්ම -**

I. ශ්‍රී ලාංකික පුරවැසියෙක් විය යුතු ය.
II. තනතුරට අදාළ රාජකාරි මනාව සේවය කිරීමට කායික හා මානසික වශයෙන් යෝග්‍ය විය යුතු ය.
III. මනා චරිතයකින් යුක්ත පුද්ගලයෙකු විය යුතු ය.

**අනෙකුත් දීමනා:**

ජීවන වියදම් දීමනාව සහ රජයෙන් අනුමත අනෙකුත් දීමනා.

**බඳවා ගැනීමේ ක්‍රමය :**

ඉහත සඳහන් මූලික සුදුසුකම් සම්පූර්ණ කළ අයදුම්කරුවන් අතුරෙන් ව්‍යුහාත්මක සම්මුඛ පරීක්ෂණයේ දී සහ / හෝ ලිඛිත තරඟ විභාගයක දී ලබාගන්නා ලකුණු අනුපිළිවෙළ අනුව බඳවාගැනීම් සිදුකරනු ලැබේ.

**සේවා කොන්දේසි:**

මෙම තනතුරු ස්ථිරය. වසර 03 ක පරිවාස කාලයකට යටත් වේ.

සේවක අර්ථසාධක අරමුදල සහ සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල : සේවකයා තම වැටුපෙන් 8% ක ප්‍රමාණයකින් හා සේවා යෝජකයා 12% ක ප්‍රමාණයකින් සේවක අර්ථසාධක අරමුදල සඳහා දායක වේ. සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල සඳහා 3% ප්‍රමාණයකින් සේවායෝජකයා ගෙවනු ලබයි.

**අයදුම් කිරීමේ පිළිවෙල :**

ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ වෙබ් අඩවියේ https://judgesinstitute.lk/ පළකර ඇති ආදර්ශ අයදුම්පත(සහතික පත්‍රවල සහතික පිටපත් සමඟ) නිසි පරිදි සම්පූර්ණ කර 2026.08.21 වැනි දිනට හෝ එදිනට පෙර ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයට ලැබෙන පරිදි පහත සඳහන් ලිපිනය වෙත ලියාපදිංචි තැපෑලෙන් යොමුකළ යුතු ය. අයදුම්පත් බහාලන ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ අයදුම්කරන තනතුරු නාමය සඳහන් කළ යුතු ය. අයදුම්පත් ලියාපදිංචි තැපෑලට යොමු කරන දිනය නොව ආයතනයට ලැබෙන දිනය, වලංගු දිනය බවට සැළකීමේ අයිතිය ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය සතුව පවතින අතර අයදුම්පත් ලියාපදිංචි තැපැල මගින් යොමු කිරීමට අමතරව https://judgesinstitute.lk/ වෙබ් අඩවියේ අයදුම් කරන තනතුරට අදාළ සබැඳිය ඔස්සේ පවතින ගූගල් පෝරමය සම්පූර්ණ කර යොමු කළ යුතු ය.

රාජ්‍ය දෙපාර්තමේන්තු, සංස්ථා සහ ව්‍යවස්ථාපිත මණ්ඩලවල දැනට සේවය කරන අයදුම්කරුවන් තම අයදුම්පත් අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානීන් මගින් එවීමට කටයුතු කළ යුතු වේ. නිසි පරිදි සම්පූර්ණ නොකරන ලද අයදුම්පත් හා අයදුම්පත් භාරගන්නා අවසන් දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. තව ද තැපෑලේ දී නැති වූ බවට ඉදිරිපත් කරනු ලබන පැමිණිලි කිසිවක් භාරගනු නොලැබේ.

අධ්‍යක්ෂ,
ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය.

ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය,
අංක 80 (5 වන හා 6 වන මහල),
අධිකරණ මාවත,
කොළඹ 12.